සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාරපරීක්ෂණය2018 **6 ශ්‍රේණිය**
இரண்டாம் தவணைப் பரீட்சை2018 தரம்6
SecondTerm Test 2018 **Grade 6**

විද්‍යාව I
விஞ்ஞானம் I
Science I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

නම ....

1. ජලයේ ඝන අවස්ථාවක් වනුයේ ,

I. ග්ලැසියර් II. ජල වාෂ්ප III. හුමාලය IV. ළිං ජලය

2. ස්කන්ධය මැනීම සඳහා යොදාගන්නා ජාත්‍යන්තර සම්මත ඒකකය (SI ඒකකය) වනුයේ

I kg II. mm III km IV. g

3. ජීවීන්ගේ අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි,

I.ප්‍රජනනය II. වර්ධනය III. චලනය IV. පෝෂණය

4. ජලයේ ලවණතාව වැඩිවන ආකාරයට දක්වා ඇති පිළිතුර වනුයේ,
   I. මිරිදිය, කරදිය, කිවුල්දිය
   II. කරදිය, කිවුල්දිය, මිරිදිය
   III. කරදිය, මිරිදිය, කිවුල්දිය
   IV. මිරිදිය, කිවුල්දිය, කරදිය

5. ලුණුවල රසායනික නාමය වනුයේ,

I. සෝඩියම් සල්ෆේට් ය. II. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ය.

III. ඇමෝනියම් ක්ලෝරයිඩ් ය. IV. සෝඩියම් ක්ලෝරයිඩ් ය.

6. මාලිමාවක් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A. චුම්බක ක්ෂේත්‍ර හඳුනා ගැනීමට යොදා ගනී.
   B. මාලිමාවක කටුව හැමවිටම උතුර, දකුණ දිශා ඔස්සේ පිහිටයි.
   C. ගුවන් නියමුවන්ට, නාවිකයන්ට, ගවේශකයන්ට ගමන් දිශාව සොයා ගැනීමට වැදගත්වේ.

   ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

   I. A පමණි II.A හා C පමණි III. A,B පමණි IV.A,B,C පමණි

7.



ඉහත රූපයේ පරිදි පෙට්‍රි දීසියකට අවර්ණ හුණු දියර දමා පැය කිහිපයක් මේසය මත තබන ලදී.පැය කිහිපයකින් නිරීක්ෂණය වූයේ හුණු දියර කිරි පැහැ වී ඇති බවය.

මින් නිගමනය වන්නේ,

I. වාතයේ කාබන්ඩයොක්සයිඩ් අඩංගු බවය.

II. වාතයේ ඔක්සිජන් අඩංගු බවය.

III. වාතයේ නයිට්‍රජන් අඩංගු බවය.

IV. වාතයේ හයිඩ්‍රජන් අඩංගු බවය.

8. පිදුරු පල් කළ ජල සාම්පලයක සිටින පැරමීසියම් නම් ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය සඳහා විද්‍යාගාරයේ දී යොදාගත් උපකරණය වන්නේ,

I. සරල අන්වීක්ෂය II. දුරේක්ෂය III. අවතල කාචය IV. සංයුක්ත අන්වීක්ෂය

9. ස්කන්ධයක් නොමැති අවකාශයේ ඉඩක් නොගන්නා දේ හැඳින්වීමට සුදුසුම වචනය වන්නේ,

I. ක්ෂුද්‍ර ජීවීන් ය. II. පදාර්ථ ය. III. වායු ය. IV. ශක්ති ය.

10. පහත සඳහන් ද්‍රව්‍යවලින් දෘඩ බවින් ඉහළම ද්‍රව්‍යය වනුයේ

I. දියමන්ති II. වීදුරු III. පුයර IV. අඟුරු

11. දණ්ඩ චුම්බක 4ක් හා යකඩ ඇන කිහිපයක් යොදාගෙන චුම්බක වල ප්‍රබලතාව ආදර්ශනය කිරීමේ ක්‍රියාකාරකම යෙදුනු සිසුන් පිරිසක් ලද නිරීක්ෂණ මෙසේ විය.මින් වැඩිම චුම්බක බලය නිරූපනය වන්නේ කවර අවස්ථාවෙන් ද?

I.


II.


III.


IV.


12. පහත දැක්වෙනුයේ ශබ්දය පිළිබඳ ප්‍රකාශ කිහිපයකි,

a. කුරුලු නාදය ස්වාභාවික ශබ්දයකි.
b. බටනලාවක ශබ්දය ස්වාභාවික ශබ්දයකි.
c. බස් රථයක ශබ්දය කෘත්‍රීම ශබ්දයකි.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වනුයේ,

I. A පමණි. II.A හා C පමණි

III.A හා B පමණි. IV.A,B හා C පමණි.

13. ඉතා ශීඝ්‍රයෙන් ක්ෂය වෙමින් පවතින ශක්ති ප්‍රභවය වනුයේ,

I. ජෛව ස්කන්ධය II. භූ තාපය

III. උදම් රළ IV. පොසිල ඉන්ධන

14.



නිදහසේ එල්ලා ඇති A චුම්බකය ආසන්නයට B චුම්බකය ගෙන ආවිට සිදු විය හැක්කේ,

I.A චුම්බකය, B චුම්බකය දෙසට ආකර්ෂණය වේ.

II, B චුම්බකය, A චුම්බකය දෙසට ආකර්ෂණය වේ.

III. A හා B චුම්බක විකර්ෂණය වේ.

IV. කිසිඳු වෙනසක් සිදු නොවේ.

15. ශ්‍රී ලංකාවේ ගල් අඟුරුවලින් ක්‍රියා කරන විදුලිබලාගාරයක් පිහිටා ඇත්තේ,

I. කොළඹ II. නොරොච්චෝලේ

III. ලක්ෂපාන IV. කොත්මලේ

16. හාවෙකුගේ හැසිරීම නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙකුට හාවා වරින් වර කන්පෙති හරවමින් සිටින බව නිරීක්ෂණය විය.හාවා කන්පෙති හැරවීමට හේතුව වනුයේ,

I. පුරුද්දක් ලෙසය.

II. ශබ්දය කන වෙත යොමු කර ගැනීමටය.

III. මැසි මදුරුවන් එලවීමටය.

IV. සුළඟ හමන දිශාව සොයා ගැනීමටය.

17. අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

I. ශාකවල හරිතප්‍රද නම් කොළ පාට වර්ණකය ඇත.

II. ශාක සංචරණය නොකරන අතර චලනද නොදක්වයි.

III. සතුන්ගේ වර්ධනයේ සීමාවක් ඇත.

IV. සතුන් විෂමපෝෂීන් වේ.

18.



ආලෝකයේ ගමන් මාර්ගය නිරීක්ෂණය සඳහා සිදුකළ ඉහත ක්‍රියාකාරකමේ දී බෝතලයට සබන් දිය කළ ජලයෙන් පුරවා ගත්තේ,

I. ජලය පාරභාෂක කිරීමටය.

II. ජලය පාරදෘශ්‍ය කිරීමටය.

III. ජලය පාරාන්ධ කිරීමටය.

IV. ජලයට ලිස්සන සුළු ස්වාභාවයක් ලබා දීමටය.

19. සත්‍ය පිළිතුර තෝරන්න.

I. ශබ්දය අධික වූ විට දී, සංගීත නාද වුවද පීඩාකාරී විය හැකිය.

II. ශබ්දය නිසා කනට හානි ඇතිවිය නොහැකිය.

III. අපට ඇසෙන සියලු ශබ්ද ස්වාභාවිකව ඇති වේ.

IV. කන කැසීම සඳහා පමණක් කනට බාහිර ද්‍රව්‍යක් ඇතුලු කිරීම සුදුසුය.

20. ශ්‍රී ලංකාවේ වර්ෂාව අඩු කාලයට ජල විදුලි නිෂ්පාදනය අඩු බැවින් රාත්‍රී 7.00 - 9.00 ත් අතර කාලයේ විදුලි කප්පාදුව සිදු කෙරේ, එම කාල පරාසය තුළ විදුලි කප්පාදුවට හේතුව වනුයේ,

I. මිනිසුන් ඉක්මනින් නින්දට යැවීම සඳහාය.

II. එම කාල සීමාවේ දී විදුලිය නිපදවා ගැනීමටය.

III. විදුලි සේවකයන්ගේ පහසුවට ය.

IV. එම කාල සීමාවේ විදුලි පරිභෝජනය වැඩි නිසාය.

II කොටස

පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4කටත් පිළිතුරු සපයන්න.

01.

a. 6 ශ්‍රේණියේ සිසුන් විසින් චුම්බක යොදාගෙන නිර්මාණය කරන ලද විනෝදාත්මක නිර්මාණයක අවස්ථා 2ක් පහත රූප සටහන්වලින් දක්වේ.මෙහිදී චුම්බකය සරුංගලයට ළං කර ඉහළට එසවුණි.ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I.සරුංගලයේ පට්ටම නිමවා තිබීමට යොදාගත් ද්‍රව්‍ය කුමක් විය හැකි ද? (ල.1)

II. දෙවන අවස්ථාවේ සරුංගලය ඉහළට එසවුණේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ල.3)

III. දෙවන අවස්ථාවේ නූල කපා දැමුවහොත් නිරීක්ෂණය කළ හැකි දේ කුමක් ද? (ල.2)

IV. දණ්ඩ චුම්බකයක් ඇඳ ඒ වටා චුම්බක බල රේඛා පැතිරී ඇති ආකාරය ඇඳ දක්වන්න. (ල.2)

V. ඔබ දැක ඇති චුම්බක වර්ග 3ක් ඇඳ දක්වන්න. (ල.3)

b.

I. ශක්ති ප්‍රභව යනු මොනවාද? (ල.1)

II. ශක්ති ප්‍රභව වර්ග 2ක් නම් කරන්න.(ල.2)

III.ඔබ නිවසේදී ශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සඳහා ගන්නා ක්‍රියා මාර්ග 2ක් සඳහන් කරන්න. (ල.2)

02. වරහන් තුළ ඇති වචන භාවිතා කර පහත හිස්තැන් පුරවන්න.

ශබ්දය සඳහා සංවේදී ඉන්ද්‍රිය (1)......................... ය. ශබ්දය නිපදවෙන්නේ යමක් (2).................... වීමෙනි. අපට ඇසෙන (3)........................ හෙවත් අවිධිමත් ශබ්ද (4)....................... ලෙස හැඳින්වේ. අපට ඇසෙන (5)............................ හෙවත් විධිමත් ශබ්ද (6)...........................ලෙස හැඳින්වේ. පරිසරයේ ඇති ශබ්ද (7)....................... හා කෘත්‍රිම ශබ්ද ලෙස ආකාර 2කි. ධ්වනිය නිපදවන වස්තු (8)........................... වේ. හොරණෑවේ හා බටනළාවේ ශබ්දය උපදින්නේ (9)...................... කම්පනය වීමෙනි. ගිටාරයේ ශබ්දය නිපදවෙන ආකාරයට ශබ්දය නිපදවෙන උපකරණයකි,(10).......................... . තවද , (11)..........................., රබානක ශබ්දය නිපදවෙන ආකාරයට ශබ්දය නිපදවෙන උපකරණයකි.

(ස්වාභාවික, රිද්මයානුකූල, කන, සංගීතය, රිද්මයානුකූල නොවන, බෙරය, කම්පනය, ඝෝෂා, වායු, වයලීනය, ධ්වනි ප්‍රභව) (ල.1×11)

03. වර්ෂාවක දී පොළොවට පතිතවන ජලයෙහි හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා විද්‍යාගාරයේ දී සැලසුම් කරන ලද පහත ක්‍රියාකාරකම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I. ඉහත නිරූපණය අනුව A,B,C යන ස්ථානවල පවතින ජලය හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න ? (ල.1×3)

II. ඉහත A අවස්ථාවේ ආකාරයට පවතින ජලය සඳහා උදාහරණ 2ක් ලියන්න. (ල.2)

III. B අවස්ථාවේ පවතින ජලය අපට ලබා ගත හැකි ක්‍රම 2ක් ලියන්න. (ල.2)

IV. නිවසේ දී හා පාසලේ දී ජලය අපතේ යන අවස්ථා 2ක් නම් කර එම අපතේ යාම් වළක්වා ගැනීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග ද සඳහන් කරන්න. (ල.2)

V. සීමිත සම්පතක් වන ජලය මිනිසාගේ නොදැනුවත්කම හා අදූරදර්ශී ක්‍රියා හේතුවෙන් දූෂණය වෙමින් පවතී. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ජලය දූෂණය වන ආකාර 2ක් සඳහන් කරන්න. (ල.2)

04.

a. පහත දැක්වෙන A කාණ්ඩයේ ප්‍රකාශයන්ට ගැළපෙන B කාණ්ඩයේ පිළිතුරට යා කරන්න.

A	B
I. ජීවීන්ගේ ශ්වසන ක්‍රියාවලියේ දී පිට කෙරෙන වායුව	ශ්වසනය
II. ප්‍රභාසංස්ලේෂණයේ අතුරු ඵලයක් වනුයේ,	කොරල් බුහුබාවා
III. තමා විසින් ආහාර නිපදවා ගන්නා ජීවීන්,	අඹ ශාක
IV. ශාක නිපදවන ආහාර මත සෘජුවම හෝ වක්‍රව යැපෙන ජීවීන්,	ස්වයංපෝෂීන්
V. සිරුර තුළ ශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය,	ඔක්සිජන්
VI. සංචරණය කළ නොහැකි නමුත් විවිධ චලන පමණක් පෙන්වන සතෙකි,	විෂමපෝෂීන්
VII. ජීවිත කාලය පුරාම වර්ධනය වේ.	කාබන්ඩයොක්සයිඩ්

(ල.1×7)

b. පහත ජීවීන් දෙබෙදුම් සුවියකට අනුව වර්ග කරන්න. (ල.4)

සමනලයා, ගොළුබෙල්ලා, ගරඬියා, මුවා, කපුටා

05. පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

I. ශාක ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ශක්තිය ලබා ගන්නේ සූර්යයා ලෝකය මගිනි, ( )

II. ආලෝක කදම්බයක් නිරූපණය ඊ හිස සහිත සරල රේඛාවක් භාවිතා කරනු ලැබේ. ( )

III. ප්‍රකාශ තන්තු හරහා ආලෝකය මගින් තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ( )

IV. පාරභාෂක ද්‍රව්‍ය තුළින් ආලෝකය ක්‍රමවත්ව ගමන් කරයි. ( )

V. වෛද්‍ය විද්‍යාවේ දී ශරීර අභ්‍යන්තරය නිරීක්ෂණය සඳහා යොදා ගන්නා උපකරණයකි එන්ඩස්කෝපය ( )

VI. තුනී වීදුරු පාරදෘශ්‍ය ද්‍රව්‍යයකි. ( )

VII. ජල විදුලි බලාගාරවල විද්‍යුත් ශක්තිය නිපදවනු ලබන්නේ ගලා යන ජලයේ අන්තර්ගත ශක්තියෙනි. ( )

VIII. හිරු එළියේ තැබූ සූර්යය තාපක උදුනේ ඇතුළේ උෂ්ණත්වයට වඩා පිටත උෂ්ණත්වය වැඩිය. ( )

IX. මී පැණි,නිශ්චිත හැඩයක් නොමැති නමුත්, නිශ්චිත පරිමාවක් ඇති පදාර්ථයකි. ( )

X. මීදුම යනු පාරාන්ධ පදාර්ථයකි. ( )

XI. සූත්‍රිකා බල්බය දීප්ත වස්තුවකි. ( )

(ල.1×11)

06.

a) වායු පදාර්ථයේ ලක්ෂණ හඳුනා ගැනීමට සිදුකරන ලද ක්‍රියාකාරකමක ඇටවුමේ රූප සටහනක් පහත දැක්වේ ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I. ක්‍රියාකාරකම ආරම්භයේ දී මීටර් කෝදුව කෙසේ තිබිය යුතු ද ? (ල.01)

II. එක් බැලූනයක් සිදුරු කළ විට ඇටවුමේ දක්නට ලැබෙන නිරීක්ෂණ සඳහන් කරන්න . (ල.2)

III. ඉහත නිරීක්ෂණවලට හේතු සඳහන් කරන්න. ? (ල.2)

IV. ඉහත ක්‍රියාකාරකමෙන් එළඹිය හැකි නිගමනය කුමක්ද ? (ල.2)

b) වරහන් තුළ සපයා ඇති සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.

I. ස්කන්ධයක් සහිත අවකාශයේ ඉඩක් ගන්නා දේ .... (පදාර්ථ, ශක්ති) ලෙස හැඳින්වේ.

II. භංගුර ද්‍රව්‍යයකි, ... (අඟුරු, තඹ)

III. ලෝහ ද්‍රව්‍ය තැලීමෙන් තහඩුබවට පත් කළ හැකි ගුණය .... (ආඝනාත්‍යතාව, තන්‍යතාව) ලෙස හැඳින්වේ

IV. විද්‍යාගාරයේ දී ද්‍රව පරිමා මැනීමට .... (මිනුම් සරාව, පරීක්ෂණ නලය) භාවිතා කරයි.

(ල.1×4)

07. ජීවීන්ගේ ලක්ෂණයක් පිළිබඳව සොයා බැලීම සඳහා බීජයක් ප්‍රරෝහණය කර පැළයක් බවට පත්වීම අධ්‍යයනයට පංති කාමරයේ දී ඔබ විසින් ක්‍රියාකාරකමක් සැලසුම් කළ යුතුව ඇත. මේ සඳහා ඔබට වියළි මුං බීජ, අඹ බීජ, දෙහි බීජ හා තේක්ක බීජ සපයා ඇත.

I. මෙම ක්‍රියාකාරකම සඳහා ඉහත බීජවලින් වඩාත් සුදුසු බීජ වර්ග 2ක් නම් කරන්න. (ල.2)

II. ඉහත ක්‍රියාකාරකම සඳහා ඔබ තෝරාගත් බීජ වර්ගය ප්‍රරෝහණය කිරීමේදී ඔබ සිදු කළ පළමු පියවර කුමක්ද? (ල.1)

III. A B



සිදුරු සහිත බඳුන සිදුරු රහිත බඳුන

a. මෙම ක්‍රියාකාරකමට ඉහත බඳුන් දෙකෙන් වඩාත් සුදුසු බඳුන කුමක් ද? (ල.1)

b. එම බඳුන තෝරා ගැනීමට හේතුව කුමක් ද? (ල.1)

IV. ඔබ ඉහත ක්‍රියාකාරකම සැලසුම් කළේ ජීවීන්ගේ කුමන ලක්ෂණයක් අධ්‍යයනය සඳහා ද? (ල.1)

V. ඔබ සඳහන් කරන ලද ජීවී ලක්ෂණය නිරීක්ෂණය සඳහා ඉහත ක්‍රියාකාරකමේ දී ලබා ගන්නා මිනුම් 2ක් සඳහන් කරන්න.

VI. ශිෂ්‍යයෙක් ඉහත ක්‍රියාකාරකම සඳහා යොදා ගත් පැළය සහිත බඳුන කාමරයක ජනේලයක් අසල තබා තිබුනි, දින කිහිපයකට පසුව බැලූ විට පැළය එක් පසකට නැමී තිබෙනු නිරීක්ෂණය විය.

a. පැළය නැමී තිබුනේ ජනේලය දෙසට ද, කාමරය දෙසට ද? (ල.1)

b. එම නිරීක්ෂණයට හේතුවන්නේ ජීවීන් සතු කුමන ලක්ෂණය ද? (ල.2)

පිළිතුරු පත්‍රය

6 ශ්‍රේණිය - විද්‍යාව

I පත්‍රය

01. 1	11. 3
02. 1	12. 2
03. 1	13. 4
04. 4	14. 3
05. 4	15. 2
06. 4	16. 2
07. 1	17. 2
08. 4	18. 1
09. 4	19. 1
10. 1	20. 4

(ල.2×20)

II පත්‍රය

01.

a) I.යකඩ ලෝහය / චුම්බක ද්‍රව්‍යයක් (ල.2)

II.සරුංගලය නිමවා ඇත්තේ යකඩ පටිවලිනි, යකඩ චුම්බක ද්‍රව්‍යයක් වන බැවින් චුම්බක ආකර්ෂණය වීම හේතුවෙන් සරුංගලය ඉහළට එසවී පවතී. (ල.2)

III.සරුංගලය චුම්බකය දෙසට ආකර්ෂණය වේ. (ල.2)

IV.



(ල.2)

V.

බුරුප චුම්බකය

දණ්ඩ චුම්බකය

U හැඩැති චුම්බකය

වලයාකාර චුම්බකය



පෙති චුම්බකය

(ල.2)

b) I.ශක්තිය ලබා දෙන දෑ ශක්ති ප්‍රභව නම් වේ.

II.සුදුසු පිළිතුරු 3කට

III.සුදුසු පිළිතුරු 2කට

02.

1. කණ

2. කම්පනය

3.රිද්මයානුකූල නොවන

4.ඝෝෂාව

5.රිද්මායානුකූල

6. සංගීතය

7. ස්වාභාවික

8. ධ්වනි ප්‍රභව

9. වායු

10. වයලීනය

11.බෙරය (ල.1×11)

03. I. A- වර්ෂය

B- භූගත ජලය

C- මතුපිට ජලය (ල.1×3)

II. වර්ෂාව, හිම, අයිස්කැට, වැස්ස (ල.2)

III. ළිං මගින්, උල්පත් මගින් (ල.2)

IV. සුදුසු පිළිතුරු 2කට (ල.2)

V. සුදුසු පිළිතුරු 2කට (ල.2)

04.

a.

I. කාබන්ඩයොක්සයිඩ්
II. ඔක්සිජන්
III. ස්වයංපෝෂී
IV. විෂම පෝෂී
V. ස්වසනය
VI. කොරල් බුහුබාවා
VII. අඹ ශාකය (ල.1×7)

b.

සමනලයා, ගොළුබෙල්ලා, ගැරඬියා, මුවා, කපුටා

- පාද ඇති
  - සමනලයා
  - මුවා
  - කපුටා
  - අං ඇති
    - මුවා
  - අං නැති
    - සමනලයා
    - කපුටා
    - හොටක් ඇති
      - කපුටා
    - හොටක් නැති
      - සමනලයා
- පාද නැති
  - ගැරඬියා
  - ගොළුබෙල්ලා
  - කවචයක් ඇති
    - ගොළුබෙල්ලා
  - කවචයක් නැති
    - ගැරඬියා

(ල.4)

05.

I.√

II.×

III.√

IV.×

V.√

VI.√

VII.√

VIII.×

IX. √

X. ×

XI. × (ල.1×11)

06.

a.

I. සමතුලිතව තිබිය යුතුය. (ල.1)

II. සිදුරු කළ බැලූනය ඇති පැත්ත ඉහළ යයි, සිදුරු නොකළ බැලූනය ඇති පැත්ත පහළ යයි. (ල.2)

III. බැලූනය සිදුරු කළ විට වාතය ඉවත්ව යාම නිසා. (ල.2)

IV. වාතයට ස්කන්ධයක් ඇති බව, (ල.2)

b.

I. පදාර්ථ II. අඟුරු III. ආහනන්‍යතාව IV. මිනුම් සරාව (ල.1×4)

07.

I. මුං බීජ, අබ බීජ (ල.2)

II. බීජ දිනක් පමණ පෙඟවීම. (ල.1)

III. a. A බඳුන (ල.1)

b. සිදුරු තිබීම නිසා වැඩි ජලය ඉවත් කිරීම. (ල.1)

IV. වර්ධනය (ල.1)

V. පැළයේ උස, පත්‍ර සංඛ්‍යාව (ල.2)

VI. a. ජනේලය දෙසට (ල.1)

b. චලනය (ල.2)